www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# සසප-සසජාශි රැස්වීමක් ශ්‍රී ලංකාවේ දී

## යුද්ධයට හා එහි ආර්ථික බර පැටවීමට එරෙහිව සමාජවාදී ක්‍රියාමාර්ගයක්

**SEP-ISSE meeting in Sri Lanka**
**A socialist program to oppose war and its economic burdens**

**2007 නොවැම්බර් 2**

සමාජවාදී සමානතා පක්ෂය සහ සමාජ සමානතාව සඳහා ජාත්‍යන්තර ශිෂ්‍යයෝ (සසජාශි) සංවිධානය, ශ්‍රී ලංකාවේ උත්සන්න කෙරෙන සිවිල් යුද්ධයට, වැඩ කරන ජනතාව මත පටවනු ලබන ආර්ථික බරට හා මූලික ප්‍රජාතන්ත්‍ර අයිතීන් මත එල්ල කෙරෙන ප්‍රහාරයන්ට එරෙහිව නොවැම්බර් 13 දා ප්‍රසිද්ධ රැස්වීමක් පවත්වනු ඇත.

කොලඹ ආන්ඩුව 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කොට දිවයින යලි යුද්ධයට ඇද දමා තිබේ. බුෂ් පාලනාධිකාරය ඇෆ්ඝනිස්ථානයේ හා ඉරාකයේ සිදු කරන අපරාධ සමග පෙල ගැසෙමින්, ජනාධිපති මහින්ද රාජපක්ෂ "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයක්" ගෙන යන බව කියාපායි. යථාර්ථය නම්, මිලිටරිය කම්කරු පන්තිය -- දෙමල, සිංහල හා මුස්ලිම් එක සේ -- අනතුරේ හෙලමින් රටේ පාලක ප්‍රභූවේ වාසිය තකා වර්ගවාදී යුද්ධයක් ගෙන යාමයි.

යුද්ධයට බිලි වී ඇති ජීවිත සංඛ්‍යාව දැනටමත් 6,000කට වැඩි යැයි තක්සේරු කෙරෙන අතර තවත් සිය ගනනක් "අතුරුදහන්" වී 250,000කට වැඩි පිරිසක් අවතැන් වී ඇත. රාජපක්ෂ ආන්ඩුව, යුද්ධය සඳහා රුපියන් බිලියන ගනන් වැය කරන ගමන්, මූර්ත වැටුප්, ආන්ඩුවේ සහනාධාර හා පොදු සේවාවන් කප්පාදු කර ඇත්තේ නගරවල හා ගම්වල වෙසෙන සාමාන්‍ය වැඩ කරන ජනතාවට ජීවිතය නොඉවසිය හැකි දෙයක් බවට පත් කරමිනි.

කම්කරුවන් සිය ජීවන මට්ටම් හා මූලික අයිතීන් ආරක්ෂා කර ගැනීමට තැත් කර ඇති සෑම අවස්ථාවක ම, ආන්ඩුව කර ඇත්තේ ඔවුන් "ත්‍රස්තවාදයට උදව් කරන්නන්" හෝ "මව්බිමට ද්‍රෝහි වන්නන්" ලෙස හංවඩු ගැසීම යි. 2004 දෘ පනවන ලද හදිසි නීතිය පවත්වා ගෙන යන රාජපක්ෂ මොන යම් හෝ දේශපාලන විරුද්ධත්වයක් මැඩීමේ එල්ලයෙන් යුක්තව නව රෙගුලාසි හා නීති හඳුන්වා දී තිබේ.

යුද්ධයට විරුද්ධ වීමේ දේශපාලන ක්‍රියාමාර්ගයකින් තොරව කම්කරුවන්ට සිය මූලික අයිතීන් ආරක්ෂා කර ගත නොහැකි ය. පසුගිය වසරේ පැවති වර්ජනවලින් හා විරෝධතාවලින් ගත හැකි කටුක පාඩම එය යි. සංස්ථාපිතයේ දේශපාලන පක්ෂ සියල්ල ම, යුද්ධය පිටුපස පෙල ගැසී ඇත, නැත හොත් ව්‍යාජ ජාත්‍යන්තර සාම ක්‍රියාදාමයන් පිලිබඳව මිථ්‍යාවන් තොරොම්බල් කරමින් සිටිති. සෑම කෙනෙක් ම යුද්ධය සඳහා කැප කල යුතු බවට ආන්ඩුව කරන ඉල්ලීම්වලට අභියෝග කිරීමට, එම පක්ෂවලට අනුබද්ධිත සමිති ප්‍රතික්ෂේප කිරීම පුදුමයට කාරනාවක් නොවේ.

වාර්ගික භේදයන් කපා ගෙන කම්කරු පන්තියේ ස්වාධීන ව්‍යාපාරයක් ගොඩනැගීමට ද එය පිටුපස පීඩිත ජනතාව බලමුලු ගැන්වීමට ද සමාජවාදී සමානතා පක්ෂය සටන් වදී. කම්කරුවන් ඒකාබද්ධ කිරීමට ද ධනපති පාලනය කම්කරු-ගොවි ආන්ඩුවකින් -- ශ්‍රී ලංකා හා ඊලම් සමාජවාදී සමූහාන්ඩුවකින් -- විස්ථාපනය කිරීමට ද අවශ්‍ය ප්‍රථම පියවර ලෙස උතුරෙන් හා නැගෙනහිරෙන් මිලිටරිය වහාම හා කොන්දේසි විරහිතව ඉවත් කල යුතු යැයි අපි ඉල්ලා සිටිමු.

වරප්‍රසාදිත අතලොස්සක ලාභ අවශ්‍යතා නොව අති මහත් බහුතරයේ දැවෙන අවශ්‍යතා සපුරාලනු පිනිස ආර්ථිකය සමාජවාදී පිලිවෙත් මත මුලුමනින් ම ප්‍රතිසංවිධානය කල යුතු යැයි සසප ඉල්ලා සිටී. මෙම ක්‍රියාමාර්ගය සාක්ෂාත් කර ගැත හැක්කේ දකුනු ආසියාව පුරා හා ජාත්‍යන්තරව සමාජවාදය සඳහා වූ වඩා පුලුල් අරගලයක කොටසක් ලෙස පමනි.

**ස්ථානය: කොලඹ මහජන පුස්තකාල ශ්‍රවනාගාරය**

**වේලාව: නොවැම්බර් 13 දා සවස 4.00**

© www.wsws.org